# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION

සුහුරුපාය, බත්තරමුල්ල


තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1620/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திக / Date — 22/10/2024 පැය 1135

**මාධ්‍ය නිවේදනය**

### නාඳුනන මෘත ශරීරයක් හඳුනා ගැනීම සඳහා මහජන සහය පැතීම.

2024.10.04 වන දින කැස්බෑව පොලිස් වසමේ තොරණවිල හංදිය ආසන්නයේදී කැස්බෑව දෙස සිට බණ්ඩාරගම දෙසට ගමන් කල ලොරි රථයක මාර්ගය හරහා ගමන් කල පුද්ගලයෙකු ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පදිකයා කළුබෝවිල රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මිය ගොස් ඇති අතර මෘත ශරීරය කළුබෝවිල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත.

මියගිය පුද්ගලයා අනතුර සිදු වූ ස්ථානයේ සිඟමන් යෙදී සිටි අයකු වන අතර මොහුගේ අනන්‍යතාවය මෙතෙක් තහවුරු වී නොමැත. මරණකරුගේ ඡායාරූපයක් මේ සමඟ ඔබ වෙත යොමු කරන අතර මේ සම්බන්ධව ඔබ මාධ්‍ය මඟින් ප්‍රචාරයක් ලබා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් යම් තොරතුරක් වෙතොත් පහත සඳහන් දුරකථන අංක වෙත දැනුම් දෙන ලෙස පොලිසිය මහජනතාවගෙන් ඉල්ලා සිටියි.

- **කැස්බෑව පොලිස් ස්ථානාධිපති - 0718592773**
- **කැස්බෑව පොලිස් ස්ථානය - 0112603742**

මෙයට අදාල ඡායාරූපයක්



**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**